# Vidyodaya Journal of Humanities and Social Sciences

VJHSS (2022), Vol. 07 (02)


# A Criminological Study on Family Environmental Factors Affecting Child Sexual Abuse in Sri Lanka


A. R. P. C. Udayakumara and H. K. S. Niranjana

Department of Criminology and Criminal Justice, University of Sri Jayewardenepura, Sri Lanka



## Article Info

Article History:
Received 14 Feb 2022
Accepted 03 June 2022
Issue Published Online
01 July 2022

**Key Words:**
Child
Child Abuse
Sexual Abuse
Family Background of the Victims



*Corresponding author
E-mail address:
Sangeethniranjana25@gmail.com

https://orcid.org/0000-0001-8169-9367



Journal homepage:
http://journals.sjp.ac.lk/index.php/vjhss

http://doi.org/10.31357/fhss/vjhss.v07i02.08

VJHSS (2022), Vol. 07 (02), pp. 107-119

ISSN 1391-1937/ISSN 2651-0367 (Online)



CC BY

Faculty of Humanities and Social Sciences 2022



## ABSTRACT

*Child sexual abuse is a serious crime prohibited by Sri Lankan criminal law, which is discussed under child abuse. There are various factors that contribute to the sexual abuse of children. This research has conducted a criminological study of the family environmental factors affecting child sexual abuse in Sri Lanka. The research was conducted in the Kalutara and Colombo districts of the Western Province and 228 sexually abused children were used as the main sample in 2015-2020. Two separate samples were also used for officers on duty with regard to parents and children from the victims. The data obtained from the research have been extensively analyzed quantitatively and qualitatively. 87% of victims of sexual abuse are girls. The majority of 42% represent the 15-17 category. 47% of the majority are victims of corruption. The boyfriend (42%) is responsible for most of the abuse. 33% of victims have been sexually abused in their own home and 32% in the home of the abuser. Family vulnerabilities such as family economic difficulties, parental ignorance, extramarital affairs, single parent family, parental separation, family disputes, parental emigration, paternal and drug abuse, various physical and mental disorders of the parents, family moral decline, and breakdown of parent-child cooperation And various problems of children, problems in the social environment can be identified as factors contributing to sexual abuse. A child faces many problems when he or she is sexually abused. This physical, mental and social impact is detrimental not only to the child affected but also to his family, society and the country as a whole. It can be pointed out that an integrated approach is more effective in controlling and preventing child sexual abuse.*

**මාතෘකාව**
ශ්‍රී ලංකාවේ ළමා ලිංගික අපයෝජනය සඳහා බලපාන පවුල් පාරිසරික සාධක පිළිබඳ අපරාධ විද්‍යාත්මක අධ්‍යයනයක්

## 1. හැඳින්වීම

අපරාධ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමේ දී ළමයින්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය කරමින්, ඔවුන්ට විරුද්ධ ව සිදුකරනු ලබන ළමා අපයෝජන පිළිබඳ මෑත කාලයේ බහුල ව සාකච්ඡාවට ලක් වේ. විශේෂයෙන් ළමා අපයෝජන අතර ළමයි ලිංගික වශයෙන් අපයෝජනයට ලක්වීම බරපතල අපරාධකාරී චර්යාවක් මෙන්ම මේ වනවිට ප්‍රබල සමාජ ගැටලුවක් දක්වා සෑම ජන සමාජයක ම වර්ධනය වී තිබේ. ශ්‍රී ලංකාවේ ළමයි ලිංගික අපයෝජනවලට ගොදුරුවීමේ නව ප්‍රවණතාවක් ඒ පිළිබඳව අධ්‍යයනයේ දී හඳුනාගත හැකිය. මෙරට ළමයි ලිංගික අපයෝජනවලට ගොදුරුවීම සඳහා විවිධ හේතු සාධක බලපාන බව පෙනෙයි. ලිංගික අපයෝජනයට ගොදුරුවන ළමයින්ගේ ගැටලු සහගත තත්ත්වයන් සහ ප්‍රධාන වශයෙන් ම වින්දිතයින්ගේ පවුල් පරිසරය ආශ්‍රිත ඇතිවන දුර්වලතා මේ සඳහා බලපාන ප්‍රබල හේතු සාධක වේ.

එක්සත් ජාතීන්ගේ සංවිධානය 1989 දී ළමයින් පිළිබඳ නිර්වචනයෙන් පසු සහ 1999 දී ළමා අපයෝජනය යන සංකල්පය පිළිබඳ අර්ථ කථනය කිරීමත් සමග ලෝකයේ වැඩි අවධානය ළමයි කෙරෙහි යොමුවීම සිදු විය. ළමා ලිංගික අපයෝජනය ඉතා සංකීර්ණ තත්ත්වයක් වන බව ලෝක සෞඛ්‍ය සංවිධානය වැඩි දුරටත් සඳහන් කරයි. ලිංගික අපයෝජනය විවිධ ස්වරූපයන් යටතේ ක්‍රියාත්මක වීම මෙයට හේතු වී ඇත. ළමයින්ට සිදුවන ලිංගික අපයෝජන ක්‍රියා ලෙස දූෂණය කිරීම, බරපතල ලිංගික අපයෝජනය, ලිංගික අතවර කිරීම, ළමයින්ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම, ව්‍යභිචාරය, තැනැත්තන් අතර දැඩි අශිෂ්ට ක්‍රියා, අස්වාභාවික වැරදි, ළමයින් කුට්ටනය කිරීම සහ ළමයින්ට අදාළ ව පළකරනු ලබන අසභ්‍ය පළකිරීම් හා ප්‍රදර්ශන ආදී වැරදි පෙන්වා දිය හැකිය (ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව, 1995;22). ලිංගික අපයෝජනවලින් ළමයි ආරක්ෂා කරගැනීමේ වගකීම ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියේ පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් නොපිරිහෙලා ඉටු කළ යුතු බව එහි 38 වන වගන්තිය මගින් අවධාරණය කරයි. (Convention of the rights of the child, 1989;12). ජාත්‍යන්තර සහ දේශීය වශයෙන් කුමන නීති රීති තිබුණ ද ළමා ලිංගික අපයෝජනය සම්බන්ධයෙන් ගෝලීය හා ශ්‍රී ලංකාවේ තත්ත්වය අයහපත් මට්ටමක පවතියි. මෙම පර්යේෂණ අධ්‍යයනයේ දී ළමා ලිංගික අපයෝජනය, ගෝලීය වශයෙන් සහ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක ස්වරූපය පිළිබඳ අවධානයක් යොමුකර තිබේ.

ළමා ලිංගික අපයෝජනය පිළිබඳ ගෝලීය තත්ත්වය විමසා බැලීම ද මෙහි දී වැදගත් වේ. 2002 වර්ෂයේ දී ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ඇස්තමේන්තු කර ඇති ආකාරයට ලෝකයේ වයස අවුරුදු 18ට අඩු ගැහැණු ළමුන්ගෙන් අවම වශයෙන් මිලියන 150ක් සහ පිරිමි ළමුන්ගෙන් මිලියන 73ක් ලිංගික සංසර්ගයේ යෙදීමෙන් හෝ වෙනත් කවර හෝ ආකාරයකින් ලිංගික අපයෝජනයකට ලක් වී ඇත (Unicef, 2012:01). එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල වාර්තා මගින් පෙන්වා දෙන ආකාරයට ලෝකය පුරා ළමුන් මිලියන දෙකක් පමණ ලිංගික අපයෝජනයට ලක් වේ. එසේ ම සාමාන්‍යයෙන් ලෝකයේ ගැහැණු ළමුන්ගෙන් 1/3 ක් සහ පිරිමි ළමුන්ගෙන් 1/7 පමණ ලිංගික අපයෝජනයට ලක් වේ (පෙරේරා, 2005:36). ලෝකයේ දිනපතා 8,500 ක් දෙනකුගේ සිරුරු තුළට HIV වෛරසය ඇතුලු වේ. මෙයින් දහසක් දෙනා අවුරුදු 15ට අඩු ළමයින් ය. මිලියන 1.5 ක් අවුරුදු 15ට අඩු ළමයින් HIV වෛරසය නිසා මියගොස් ඇත (මුතුකුමාරණ, 1997:25). ඒ අනුව ළමයි ලිංගික අපයෝජනවලට ගොදුරුවීමේ අනිටු ප්‍රතිඵල නිසා ඔවුන්ට ජීවිතයෙන් ද වන්දි ගෙවීමට සිදුව තිබෙන බව පැහැදිලි වේ. ශ්‍රී ලංකාවේ ද මෑත කාලයේ වාර්තා වූ ලිංගික අපයෝජන කිහිපයක මෙවැනි දැඩි ප්‍රචණ්ඩකාරී සිදුවීම් දැකගත හැකි විය.

ලෝකයේ අනෙකුත් රටවල්වලට සාපේක්ෂව ආසියාතික රටවල ළමයින් ලිංගික අතවරයට ගොදුරුවීම් බහුලව සිදු වේ. එක්සත් ජාතීන්ගේ සංවිධානය පෙන්වා දෙන ආකාරයට ලෝක ළමා ජාවාරමෙන් 50%ක් සිදුවන්නේ දකුණු ආසියාව හා කාම්බෝජය කේන්ද්‍ර කරගෙනය. මෙම දරුවන් බහුතරයකට ලිංගික කටයුතුවල යෙදීමට ද සිදු වේ (රත්නවේල්, 2005:4). පකිස්ථානයේ සෑම අවුරුද්දක ම ස්ත්‍රීන් හා ළමයින් 200,000ක් පමණ වහල්කමට විකුණන බව සඳහන් වේ. ඒ අනුව ඇතැම් අය විකුණනු ලබන්නේ ලිංගික කර්මාන්තය උදෙසා මය. 1991 වර්ෂය වනවිට ඉන්දියාවේ දී ළමා ගණිකාවන් 500,000ක් ද, බංගලාදේශයේ 100,000ක් ද සිට ඇත. නූගත්කම හා අවිධිමත්කම හමුවේ ලිංගික අතවරයට ලක්වන ආසියාවේ ඒඩ්ස් රෝගීන් බහුල ව ව්‍යාප්ත වී සිටියි. තායිලන්තයේ සෑම අවමඟුල් තුනකින් ම එකක් ඒඩ්ස් රෝගය නිසා සිදුවේ. 1999 දී සංඛ්‍යා ලේඛනවලට අනුව අවුරුදු 25ට අඩු ඒඩ්ස් රෝගය ශරීරගතවූවන් අතර බංගලාදේශයේ 4,000ක් ද, ඉන්දියාවේ 1,200,000ක් ද, නේපාලයේ 11,000ක් ද, පකිස්ථානයේ 24,000ක් සහ ශ්‍රී ලංකාවේ 2,500ක් වශයෙන් වාර්තා වී තිබේ. මොවුන්ගෙන් බොහෝ දෙනෙක් ළාබාල වියේ පසුවන ළමයින් වේ (නිශ්ශංක, 2004: 22).

ළමා ලිංගික අපයෝජනය සම්බන්ධයෙන් ඉහත සඳහන් කළ රටවල සහ ලෝකයේ අනෙකුත් රටවල ද පර්යේෂකයින් විසින් පර්යේෂණ රාශියක් සිදුකර තිබෙන අතර මෙම පර්යේෂණ බොහෝමයක ලිංගික අපයෝජනය සඳහා බලපාන හේතු සාධක සම්බන්ධයෙන් විමසීමට ලක්කර තිබේ. තායිලන්තයේ ලිංගික අපයෝජනයට ලක් වූ ළමයි 60 ක් යොදාගෙන සිදුකරන ලද අධ්‍යයනයක් මගින් පෙන්වා දෙන්නේ වින්දිතයින්ගේ පවුලේ දුර්වලතා ලිංගික අපයෝජනයට ලක්වීම සඳහා ප්‍රබලව ම හේතු වී ඇති බවයි. මෙම අධ්‍යයනයට අනුව ලිංගික

අපයෝජනයට ලක් වූ වින්දිතයින් 61.7% දෙමාපියන් දික්කසාද වී ඇති බවයි. එසේ ම දෙමාපියන් පවුලෙන් වෙන්වීම, දෙමාපියන් මරණයට පත්වීම ආදී හේතූන් නිසා ලිංගික අපයෝජනයට ලක් වූ ප්‍රතිශතය 71.3%කි. පවුලේ දිළිඳු බව නිසා 55%ක් ද, දෙමාපියන් මත්ද්‍රව්‍ය භාවිත නිසා 38.3%ක් ද සහ පවුලේ සාමාජිකයින් මානසික රෝගයකින් පෙළීම නිසා 15% ක් ද ලිංගික අතවරවල වලට ගොදුරු වී තිබේ (Trangkasombat, 2008:1461-1463). 2010 දී මැලේසියාවේ ක්වාලලම්පූර් (Kuala Lumpur) රෝහල ආශ්‍රයෙන් අහමඩ් ඇතුලු පිරිස විසින් සිදුකරන ලද අධ්‍යයනය අනුව ද ලිංගික අපයෝජනය සඳහා පවුලේ දුර්වලතා වැඩි වශයෙන් ම බලපා තිබේ (Cheah & Yuen, 2016,89). ඕස්ට්‍රේලියාවේ 1992 දී වික්ටෝරියා ප්‍රදේශයේ සිටින ගැහැණු හා පිරිමි ළමුන්ගේ වෘත්තීමය ලිංගික සම්බන්ධතා සහ ඔවුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ සිදුකළ අධ්‍යයනයට අනුව ද ලිංගික අපයෝජනය සඳහා නිවාස නොමැතිකම, පවුලෙන් ප්‍රතික්ෂේප වීම, දෙමාපියන් නොමැතිවීම වැනි සාධක බලපා තිබේ (Hancock, 1992:29-52). ඇමරිකාවේ එච්.අයි.වී වෛරසය වැළඳුණු ළමයින් 96ක් පිළිබඳ 1987-1989 දී සිදුකළ අධ්‍යයනයකට අනුව ලිංගික අපයෝජනය සඳහා ප්‍රධාන වශයෙන් ම මත්පැන්, මත්ද්‍රව්‍ය භාවිතය, දෙමාපියන් ගණිකා වෘත්තියෙහි නියැලීම, දෙමාපියන් නොමැතිකම, දිළිඳු බව හා දරුවන්ගේ නිදන්ගත රෝගාබාධායන් ඇතුලු නිවසෙහි අපචාරී චර්යාවන් වැඩිවීම බලපා තිබේ (Gutman et al.,1991). ඒ අනුව ලෝකයේ විවිධ රටවල් කේන්ද්‍රකරගෙන ළමා ලිංගික අපයෝජනය සම්බන්ධයෙන් සිදුකළ පර්යේෂණ අධ්‍යයනයන්ට අනුව ලිංගික අපයෝජනය සඳහා බලපා ඇති ප්‍රධාන හේතු සාධක ලෙස පවුල් පරිසරය ආශ්‍රිතව ඇති වී තිබෙන අනාරක්ෂිත බව හඳුනාගෙන තිබේ.

ශ්‍රී ලංකාවේ ළමා ලිංගික අපයෝජනය විවිධ හේතු සාධක මත පදනම්ව නව ප්‍රවණතාවකින් වර්තමානය වන විට වර්ධනය වී තිබෙන බව පෙනේ. 1980 සහ 1990 දශකවල ළමයි ලිංගික අපයෝජනයට ලක්වීම කෙරෙහි සමාජ පර්යේෂකයින්ගේ අවධානය යොමු වී ඇත. ශ්‍රී ලංකාව, ළමයින් ලිංගික කටයුතු සඳහා යොදා ගැනීමට සුදුසු තැනක් යැයි සංචාරකයින් අතර ජනශ්‍රැතියේ ප්‍රචාරය වී ඇත. (රත්නපාල, 2014;52). ස්පාටකස් සඟරාව මගින් "පිරිමි සමලිංගික සේවනයෙහි පාරාදීසය" ලෙසත් ලිට්ල් ජෝන් නම් සඟරාවේ "ගණිකාවන් අවශ්‍ය නම් තායිලන්තයටත්, පිරිමි ළමා ගණිකාවන් අවශ්‍ය නම් ශ්‍රී ලංකාවටත් යායුතුය" (අමරසේකර, 2012;147) යනුවෙන් දක්වා ඇත. ඉහත සඟරා දෙක මගින් පිරිමි ළමා ගණිකාවන් සම්බන්ධයෙන් ලෝකයේ ම අවධානය ශ්‍රී ලංකාව වෙත යොමුකර තිබේ. සමාජ විද්‍යාඥයින්ගේ පර්යේෂණ ලිපි හා වාර්තා අනුව ලංකාවේ ගණිකා වෘත්තියේ යෙදෙන ළමයින්ගේ සංඛ්‍යාව 80,000ක් පමණ වේ. ලෝකයේ වෙනත් රටවල් සමග සැසඳීමේ දී මෙම සංඛ්‍යාව දෙවැනි වන්නේ ලක්ෂ 4ක් පමණ ළමා ගණිකාවන් සිටින තායිලන්තයට පමණි.

ලංකාවේ සිදුකළ පර්යේෂණ අනුව පැහැදිලි වන්නේ වර්තමානයේ වයස අවුරුදු 18ට අඩු පිරිමි ළමයි 18%ක් ද, ගැහැණු ළමුන් 5.4%ක් ද ළමා කාලයේ දී ලිංගික අතවරයකට ලක් වී ඇති බවයි (අමරසේකර, 2015;118). කෙසේ නමුත් වර්තමානයේ ශ්‍රී ලංකාවේ ළමයින්ට සිදුවන ලිංගික අපයෝජන ප්‍රමාණය මීට වඩා ඉහළ අගයක් ගන්නා බව පැහැදි වේ. ශ්‍රී ලංකාවේ ළමා ලිංගික අපයෝජන වැරදි සම්බන්ධයෙන් කොළඹ පොලිස් ළමා හා කාන්තා කාර්යාංශය වෙත වාර්තා වූ සංඛ්‍යා දත්ත අඩංගු තොරතුරු පහත වගුවෙහි දක්වා තිබේ.

**වගු අංක 1.** ශ්‍රී ලංකාවේ සිදුවන ළමා ලිංගික අපයෝජනය

| ලිංගික අපයෝජනය | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|---|---|---|---|---|
| ලිංගික අතවර කිරීම | 1238 | 1206 | 1250 | 1488 | 1255 | 1225 | 1332 | 1309 | 1315 |
| ළමයින්ට අදාළ ව පලකරනු ලබන අසභ්‍ය පළකිරීම් හා ප්‍රදර්ශන | 9 | 12 | 7 | 7 | 6 | 7 | 9 | 7 | 16 |
| කුට්ටනය කිරීම | 55 | 2 | 2 | 9 | 4 | 4 | 7 | 2 | 3 |
| ළමයින්ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම | 0 | 24 | 23 | 58 | 36 | 28 | 27 | 20 | 17 |
| අපහරණය කිරීම | 814 | 767 | 731 | 809 | 748 | 741 | 819 | 741 | 714 |
| දූෂණය කිරීම | 1808 | 1722 | 1651 | 1582 | 1516 | 1374 | 1384 | 1412 | 1564 |
| අස්වාභාවික වැරදි | 138 | 22 | 19 | 16 | 22 | 28 | 8 | 10 | 5 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| බරපතල ලිංගික අපයෝජනය | 612 | 811 | 728 | 749 | 584 | 525 | 670 | 640 | 628 |
| ව්‍යාභිචාරය | 18 | 46 | 32 | 42 | 33 | 29 | 28 | 43 | 42 |
| තැනැත්තන් අතර දූඩි අශිෂ්ට ක්‍රියා | 2 | 5 | 3 | 12 | 11 | 21 | 0 | 7 | 2 |
| **එකතුව** | **4694** | **4617** | **4446** | **4772** | **4215** | **3982** | **4284** | **4191** | **4306** |

(මූලාශ්‍රය - කොළඹ පොලිස් ළමා හා කාන්තා කාර්යාංශය, 2012-2020)

ඒ අනුව 2012-2020 දක්වා වසර නමයක කාලය තුළ දී ළමයි ලිංගික අපයෝජනයට ලක්වීම් 39,507 ක් වාර්තා වී තිබේ. මෙම සංඛ්‍යාව ශ්‍රී ලංකාව වැනි කුඩා රටකට ඉතා ඉහළ අගයක් වන අතර එක් වසරක වාර්තාවීමේ සාමාන්‍යය 4,390 ක් වේ. විශේෂයෙන් ම ගැහැණු ළමයි දූෂණයට ලක්වීම වැඩි වශයෙන් වාර්තා වී තිබීම ඉතා ම ඛේදනීය තත්ත්වයක් වේ. මෙසේ අපයෝජනයට ලක් වූ සෑම ළමයකුගේ ම පවුල් පරිසරය සම්බන්ධයෙන් විමසා බැලීමේ දී ළමයි බහුතරයකට අතවර සිදුවීමට පවුලේ අනාරක්ෂිත භාවය බලපා තිබෙන බව හඳුනාගත හැකිය. දිස්ත්‍රික්ක අනුව සලකා බැලීමේ දී ඉහත වර්ෂ නවය තුළ දී ළමා ලිංගික අපයෝජන වැඩි වශයෙන් ම වාර්තා වී තිබෙන්නේ පිළිවෙලින් කුරුණෑගල, අනුරාධපුරය, ගම්පහ, රත්නපුරය, කොළඹ, ගාල්ල, කළුතර, මහනුවර, කෑගල්ල, පුත්තලම යන දිස්ත්‍රික්කවල ය. වර්ෂ නවය තුළ දී ලිංගික අපයෝජන අඩුවෙන් වාර්තා වී තිබෙන්නේ මන්නාරම, කිලිනොච්චිය, මුලතිව්, වව්නියාව සහ මඩකලපුව යන දිස්ත්‍රික්කවල ය (මූලාශ්‍රය-කොළඹ පොලිස් ළමා හා කාන්තා කාර්යාංශය, 2012-2020). ඉහත සංඛ්‍යා දත්ත වාර්තා වන ප්‍රමාණය පමණක් වන අතර නිලීන අපරාධ ගණයට වැටෙන තවත් බොහෝ ලිංගික අපයෝජන ක්‍රියා රාශියක් තිබිය හැකි බව කිව යුතුය.

ළමයි ලිංගික අපයෝජනවලට ගොදුරුවීමට සංචාරක ව්‍යාපාරය, යුද ගැටුම්, පවුල් හා පාරිසරික දුර්වලතා, දරුවන්ගේ ශාරීරික හා මානසික දුබලතාවන්, සමවයස් කණ්ඩායම්වල බලපෑම, සමාජ හා සංස්කෘතික සාධක, සන්නිවේදන හා තාක්ෂණික සාධක, ස්වභාවික හා වෙනත් ආපදා තත්ත්වයන් බලපානු ලැබේ. ශ්‍රී ලංකාවේ ළමා ලිංගික අපයෝජනය පිළිබඳව පර්යේෂණ සිදුකර ඇත්තේ ඉතා අවම සංඛ්‍යාවක් වන අතර එසේ සිදුකළ පර්යේෂණ කිහිපයක ළමා ලිංගික අපයෝජනය සඳහා බලපාන හේතු සාධක විවරණය කර තිබේ. ඒ අනුව ළමා ලිංගික අපයෝජනය පිළිබඳ ශ්‍රී ලංකාවේ පුත්තලම දිස්ත්‍රික්කය ආශ්‍රයෙන් අපයෝජනයට ලක් වූ ළමයි 183ක් යොදාගෙන සිදු කළ අධ්‍යයනයට අනුව ලිංගික අපයෝජනයට ලක් වීම කෙරෙහි පවුල් දුර්වලතා බලපා ඇති බවට සොයාගෙන තිබේ (Amarathna & Vidanapathirana, 2016,34-36). 2001 දී සමෘද්ධි අමාත්‍යාංශයේ ග්‍රාම සංවර්ධන පර්යේෂණායතනය විසින් ප්‍රකාශයට පත්කරන ලද අධ්‍යයනයට අනුව මව්වරු විදේශ ගතවීම, පියවරුන්ගේ මත්පැන් මත්ද්‍රව්‍ය භාවිතය, දරුවන්ට මවගේ රැකවරණය අහිමිවීම, මව්පියන් වෙන්වීම, අනියම් සම්බන්ධතා හෝ දෙවැනිවර විවාහවීම, අසභ්‍ය චිත්‍රපට පුවත්පත් රූපවාහිනිය ඇතුලු ජනමාධ්‍ය, කාන්තාවන්ගේ ඇඳුම් විලාසිතා ආදිය හා වාණිජ්‍යත්වය පසුපස හඹායාම වැනි සාධක ලිංගික අපයෝජනයට බලපා තිබෙන බව පෙන්වා දෙයි (පලිපාන, 2001:3-4). එසේ ම මහාචාර්ය සරත් අමරසිංහ විසින් 2002 දී ජාත්‍යන්තර කම්කරු සංවිධානය හා එක්ව සිදුකළ අධ්‍යයනය, අචාර්ය ඒ.ජේ. වීරමුණ්ඩ විසින් කලුතර දිස්ත්‍රික්කයේ පාසල් තුනක් පාදකකරගෙන සිදුකළ අධ්‍යයනය, 1999-2001 දී ඇමරිකානු ජාතික පර්යේෂිකා ජොඩි මිලර් (Jody Miller) විසින් ශ්‍රී ලංකාවේ වෙරළාශ්‍රිත ප්‍රදේශවල ලිංගික කටයුතුවල යෙදෙන ළමයින් පිළිබඳ කළ අධ්‍යයනය මගින් ළමයි ලිංගික අපයෝජනවලට ගොදුරුවීමට බලපා ඇති හේතු සාධක පිළිබඳව සාකච්ඡාකර තිබේ. මේ අතරින් පවුල් පරිසරය ආශ්‍රිත දුර්වලතා ද ළමා ලිංගික අපයෝජනයට බලපාන ප්‍රධාන සාධකයක් ලෙස හඳුනාගෙන ඇත.

ළමයකු ලිංගික අපයෝජනයට ලක්වීම නිසා විශාල ගැටලු ගණනාවකට මුහුණපානු ලබයි. දරුවාගේ ජීවිතයට දිගුකාලීන වශයෙන් සහ කෙටිකාලීන වශයෙන් මෙමගින් බලපෑම් ඇති කරන අතර දරුවා ජීවත්වන පවුලට, ඥාතීන්ට සහ සමාජයට ද විශාල බලපෑමක් ඇති කරයි. ළමයින් ලිංගික වශයෙන් අපයෝජනයට ලක්වීම පාලනය හා නිවාරණය කිරීම අත්‍යවශ්‍යයෙන් ම සිදුවිය යුතු ය. සමස්ත සමාජයේත්, රටේත් ප්‍රගමනයට එය ප්‍රබල ලෙස බලපානු ලැබේ.

මෙම පර්යේෂණයේ පර්යේෂණ ගැටලුව වන්නේ ළමා ලිංගික අපයෝජනය සඳහා බලපාන පවුල් පාරිසරික හේතු සාධක මොනවාද? යන්න හඳුනාගැනීමයි. පර්යේෂණය සිදුකිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ ළමා ලිංගික අපයෝජනය සඳහා බලපාන පවුල් පාරිසරික හේතු සාධක පිළිබඳ අධ්‍යයනය කිරීම යි. එසේ ම ලිංගික අපයෝජනවලට ගොදුරු වූ ළමයින්ගේ පවුලේ සමාජ, ආර්ථික තත්ත්වය අධ්‍යයනය කිරීම, ලිංගික අපයෝජනය නිසා වින්දිත ළමයි සහ පවුල මුහුණදෙන ගැටලු

අධ්‍යයනය කිරීම සහ ලිංගික අපයෝජනය පාලනය හා නිවාරණය සඳහා යෝජනා ඉදිරිපත් කිරීම පර්යේෂණයේ උප අරමුණු වේ.

## 2. පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය කලුතර හා කොළඹ දිස්ත්‍රික්ක ආශ්‍රයෙන් සිදුකරනු ලැබීය. සමස්ත නියැදිය 315ක් වේ. ජාතික ළමා ආරක්ෂක අධිකාරියට 2015-2020 දක්වා ළමා ලිංගික අපයෝජනය සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලි 948 කින් විවිධ හේතු නිසා (අසත්‍ය පැමිණිලි, විමර්ශනය වෙමින් පවතින පැමිණිලි සහ වයස අවුරුදු 5ට අඩු ළමයි සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලි) පැමිණිලි 581 ක් ඉවත් කළ පසු සංගහණය වන 367 කින් 228 ක් වන නියැදිය තෝරාගන්නා ලදී.

### 2.1 නියැදිය තෝරා ගැනීම

n = නියැදි තරම (Sample Size)
d = දෝෂ ආන්තිකය (Margine of error)
s = නියැදි විචල්‍යතාව (Sample variation)

විශ්වාස මට්ටම 95% කින් නිගමන ඉදිරිපත් කරන බැවින් එහි දී Z අගය 1.96 කි.

s = pq= නියැදි විචල්‍යතාව p හි උපරිම අගය 0.5 දී වන බැවින් = 0.5×(1-0.5) = 0.25

දෝෂ ආන්තිකය 5%ක් ලෙස ගන්නා ලදී.

$$n = \frac{n_0}{1+ [n_0 - 1]}$$

$$n_0 = \frac{z^2 \text{«} s}{d^2}$$

$$n_0 = \frac{1.96^2 \text{«} 0.1483}{(0.05)^2}$$

$$n_0 = 227.883$$
$$= \underline{\underline{228}}$$

අනෙක් නියැදි දෙක සඳහා වින්දිතයින්ගේ දෙමාපියන්ගෙන් සමන්විත 47ක නියැදියක් ද, ළමයින් පිළිබඳ කටයුතු කරන රාජ්‍ය නිලධාරීන්ගෙන් සමන්විත 40ක නියැදියක් ද ඇතුළත් වේ.

ඒ අනුව සමස්ත නියැදිය 315කි. ළමයින්ගේ සහ දෙමාපියන්ගේ නියැදිය සරල සසම්භාවී නියැදි ක්‍රමයයෙන් ද, නිලධාරීන්ගේ නියැදිය පරමාර්ථගත නියැදි ක්‍රමයෙන් ද තෝරාගෙන ඇත.


පර්යේෂණය සිදුකිරීමට ප්‍රාථමික මූලාශ්‍ර හා ද්විතීයික මූලාශ්‍ර භාවිත කර තිබේ. ප්‍රාථමික මූලාශ්‍ර ලෙස ක්ෂේත්‍රයෙන් ලබාගත් දත්ත භාවිත කළ අතර ද්විතීයික මූලාශ්‍ර ලෙස අධ්‍යයනයේ පර්යේෂණ මාතෘකාවට අදාළ ව පළ වී ඇති තොරතුරු සහිත වාර්තා, සංඛ්‍යා ලේඛන, සඟරා, ලිපි ලේඛන, භාවිත කරනු ලැබීය.පර්යේෂණයේ ප්‍රාථමික දත්ත රැස් කිරීම සම්මුඛ සාකච්ඡා ක්‍රමය, ප්‍රශ්නාවලිය සහ නිරීක්ෂණය යන ක්‍රමවේද භාවිත කරන ලදී. ළමයින්ගෙන් සහ භාරකරුවන්ගෙන් තොරතුරු රැස් කිරීමට ආකෘතිමය සම්මුඛ සාකච්ඡා උපලේඛනයක් සහ නිලධාරීන්ගෙන් දත්ත ලබා ගැනීමට ප්‍රශ්නාවලියක් ද භාවිත කරනු ලැබීය. දත්ත විශ්ලේෂණය කිරීම ප්‍රමාණාත්මක හා ගුණාත්මක ලෙස විශ්ලේෂණය කරණු ලැබීය. ප්‍රමාණාත්මක විශ්ලේෂණය සඳහා සමාජීය විද්‍යාවන් සඳහා වන සංඛ්‍යානමය මෘදුකාංගය - Statistical Package for the Social Sciences (SPSS) සහ Microsoft Excel මෘදුකාංග භාවිත කළ අතර SPSS මගින් ලිංගික අපයෝජනය සඳහා බලපාන හේතු සාධක පිළිබඳ සාධක විශ්ලේෂණයක් සිදුකරන ලදී. Microsoft Excel මෘදුකාංගය මගින් සටහන් වගු, ප්‍රස්තාර නිර්මාණය කර ඇත. දත්ත දායකයින්ගේ හැඟීම්, භාවයන්, අදහස් හා ඉරියව් ආදිය විශ්ලේෂණය ගුණාත්මක විශ්ලේෂණය මගින් සිදුකර තිබේ.

## 3. ප්‍රතිඵල හා සාකච්ඡාව

මෙහි දී පළමුව ලිංගික අපයෝජනයට අදාළ තොරතුරු පිළිබඳ සාකච්ඡා කිරීම වඩා වැදගත් වේ. ලිංගික අපයෝජනවලට ගොදුරු ළමයි 228ක නියැදියෙන් ලබාගත් දත්ත විශ්ලේෂණය කිරීම මෙහි දී සිදුකර තිබේ. ඒ අනුව ලිංගික අපයෝජනයේ ස්වභාවය පිළිබඳ රූපසටහන 1හි නිරූපණය කර ඇත.

ඒ අනුව ළමයි බහුතරයක් දූෂණයට ලක් වී ඇති බව පෙනෙයි. දූෂණයට ලක් වූ වින්දිතයින්ගේ ප්‍රතිශතය 47%කි. 35%ක් ලිංගික අතවර සිදුකිරීම නිසාද, 6% ක් කළවා සංසර්ගයේ යෙදීමෙන් ද, 5%ක් ගුද සංසර්ගයේ යෙදීමෙන් ද 3% බැගින් මුඛ සංසර්ගයේ යෙදීම සහ ලිංගික අවයව පෙන්වීම නිසා ද, 1%ක් අසභ්‍ය ප්‍රකාශන පළකිරීම් නිසා ද ලිංගික අපයෝජනයට ගොදුරු වී තිබේ. ළමයින් අපයෝජනයට ලක්කළ පුද්ගලයින් (අපයෝජකයා) කවුරුන් ද යන්න පිළිබඳව ද මෙම අධ්‍යයනයේ දී හඳුනාගෙන ඇත. ඒ අනුව වැඩි වශයෙන් ම ළමයින්ට ලිංගික අතවර සිදුකර තිබෙන්නේ ඔවුන්ගේ පෙම්වතා විසින්ය. පෙම්වතා අපයෝජකයකු වීමේ ප්‍රතිශතය 42%කි. විශේෂයෙන් ගැහැණු ළමයි ප්‍රේම සම්බන්ධතා පැවැත්වීමේ දී ඉතා අවබෝධයෙන් කටයුතු කළහොත් පෙම්වතුන්ගෙන් සිදුවන අපයෝජන බොහෝමයක් වළක්වාගැනීමේ හැකියාව පවතියි. අපයෝජන සිදුකළ පුද්ගලයින් පිළිබඳව තවදුරටත් විමසා බැලීමේ දී පසුව පිළිවෙලින් අසල්වාසියෙක් 14%ක් ද, ඥාතියෙක්

13%ක් ද, පියා 9%ක් ද, දන්නා හඳුනන අයකු 8%ක් ද, ගුරුවරයකු හා පූජකයෙකු 4% බැගින් ද සුලු පියා සහ නොදන්නා අයෙකු 3% බැගින් ද මිතුරකු 1%ක් වශයෙන් ලිංගික අපයෝජනවලට සම්බන්ධ වී තිබේ. ඒ අනුව ළමයින් බහුතරයකට ලිංගික අපයෝජන සිදුකර තිබෙන්නේ ඔවුන් හොඳින් දන්නා හඳුනන පුද්ගලයින් බව තහවුරු වේ. ලිංගික අපයෝජනවලින් බහුතරයක් සිදු වී තිබෙන්නේ වින්දිතයින්ගේ සහ අපයෝජකයින්ගේ නිවෙස්වල දී වීම තවත් විශේෂත්වයකි. 33% කට වින්දිතයින්ගේ නිවස තුළදී ම අපයෝජනය සිදු වී තිබෙන අතර 32%කට අපයෝජකයින්ගේ නිවෙස්වල දී අතවරය සිදු වී තිබේ. ලිංගික අපයෝජනවලට ගොදුරුවීමට ඇති දැඩි අනාරක්ෂිත ම ස්ථාන දෙක හැටියට ඉහත ස්ථාන හඳුනාගත හැකි අතර එහි දී සිදුවන ලිංගික අපයෝජනවලින් බහුතරයක් වින්දිතයින්ගේ අනුමැතිය මත සිදු වී ඇති බව අනාවරණ වේ. වින්දිතයින්ගෙන් 43%කට අපයෝජනය සිදු වී තිබෙන්නේ ඔවුන්ගේ කැමැත්ත අනුවය. මෙම අපයෝජනයට පෙර ද වින්දිතයින්ගෙන් 31%කට මොහුගෙන් ලිංගික අතවර සිදු වී තිබේ. අපයෝජනයෙන් පසුව ද වින්දිතයින්ගෙන් 24%කට මොහුගෙන් නැවත නැවත අපයෝජන සිදුව තිබේ. අපයෝජකයින්ගෙන් 65%ක් වින්දිතයින්ගේ නිවසට යමින් එමින් සම්බන්ධතා පවත්වා තිබේ. එසේ ම වින්දිතයින්ගෙන් 21%ක් වෙනත් අපයෝජකයකුගෙන් ද ලිංගික අතවරයට ලක් වී ඇත. වින්දිතයින්ගෙන් 55%ක් ලිංගික අපයෝජනයේ දී කිසිදු ප්‍රතිලාභයක් බලාපොරොත්තු වී නැත. එසේ වුවත් වින්දිතයින්ගෙන් 30%ක් පෙම්වතා විවාහකර ගැනීමේ පොරොන්දුව නිසා ද, 12%ක් ආදරය, 9%ක් මුදල්, 4% බැගින් ලිංගික ආශාව සහ නිවසේ ආහාරපාන අවශ්‍යතාව සපුරා ගැනීම ද ලිංගික අපයෝජනයේ ප්‍රතිලාභ වශයෙන් බලාපොරොත්තු වී තිබේ. කෙසේ නමුත් ලිංගික අපයෝජනයට අදාළ ඉහත තොරතුරු පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීමේ දී පවුල් පරිසරය ආශ්‍රිත දුර්වලතා අපයෝජනයට ලක් වීම කෙරෙහි ප්‍රබල ලෙස බලපා ඇති බවට විශ්වාස කළ හැකිය. වින්දිතයින්ගේ නිවසට අපයෝජකයින් පැමිණීම, නැවත නැවත ලිංගික අතවරයට ලක්වීම ආදී කාරණා මගින් පවුල් පරිසරය අනාරක්ෂිත බව පැහැදිලි වේ.




**රූපසටහන 1.** ලිංගික අපයෝජයේ ස්වභාවය(මූලාශ්‍රය - අධ්‍යයන නියැදි සමීක්ෂණය 2019-2020)1

ළමයි ලිංගික අපයෝජනවලට ගොදුරුවීම සඳහා බලපා ඇති හේතු සහ අවධානම් සාධක පර්යේෂණයේ දී හඳුනාගත හැකිවිය. එම සාධක වින්දිතයින්ගේ ගැටලු, පවුලේ ගැටලු සහ සමාජ පාරිසරික ගැටලු ලෙස වර්ගකර විග්‍රහ කළ හැකිය. වින්දිත සාධක පිළිබඳ සලකා බැලීමේ දී ඔවුන්ගේ ස්ත්‍රී පුරුෂ භාවය, වයස, අධ්‍යාපන මට්ටම හා ඇතැම් චර්යාත්මක ලක්ෂණ හා අන්තර් පුද්ගල සම්බන්ධතා පවත්වන ආකාරය සෘජුව ම ලිංගික අපයෝජනවලට ලක්වීම කෙරෙහි බලපා තිබේ. ලිංගික අපයෝජනවලට ගොදුරු වූ වින්දිතයින්ගෙන් බහුතරයක් ගැහැණු ළමයි වේ. ඒ අනුව වින්දිතයින්ගෙන් 87%ක් ගැහැණු ළමයි වන අතර පිරිමි ළමයි 13%කි. මෙසේ අපයෝජනයට ලක් වූ ගැහැණු ළමයින්ගෙන් බහුතරයක් ප්‍රේම සම්බන්ධතා ගොඩ නගා ගැනීම සහ සිය පෙම්වතාගෙන් අපයෝජනයට ලක්වූවන්ය. ළමයෙක් ප්‍රේම සම්බන්ධතාවක් ඇති කරගැනීම වළක්වාලීම හෝ පාලනයක් සිදුකිරීමට නොහැකිවීම දුර්වල දෙමාපියභාවයේ ලක්ෂණයකි. ලිංගික අපයෝජනවලට ගොදුරුවීමට වයස ද අවදානම් සාධකයකි. පර්යේෂණ ප්‍රතිඵල අනුව අපයෝජනයට ලක් වූ බහුතරයක් එනම් 42%ක් 15-17 වයස් කාණ්ඩයට අයත් වේ. 12-14 වයස් කාණ්ඩයේ 33%ක්

ද, 9-11 වයස්කාණ්ඩයේ 17%ක් ද, 6-8 වයස්කාණ්ඩයේ දී 9%ක් ද අපයෝජනයට ලක් වී තිබේ. ඒ අනුව වයස අවුරුදු 12ට වැඩි ළමයි, විශේෂයෙන් ගැහැණු ළමයි දැඩි අවධානම් කණ්ඩායමක් වේ. වින්දිතයින්ගේ අධ්‍යාපන මට්ටම සම්බන්ධයෙන් විමසා බැලීමේ දී 35%ක් 10-11 ශ්‍රේණිවල ද, 31%ක් සාමාන්‍යපෙළ විභාගයට මුහුණදීම ද, 18%ක් 7-9 ශ්‍රේණිවල ද, 10%ක් 4-6 ශ්‍රේණිවල ද, 2%ක් 1-3 ශ්‍රේණිවල ද අධ්‍යාපනය ලබයි. සාමාන්‍යපෙළ විභාගය සමත් ප්‍රතිශතය 4%ක් සහ උසස්පෙළ හදාරණ 1%ක් සිටියි. වර්තමානයේ පාසල් අධ්‍යාපනය හදාරණ ප්‍රතිශතය 44%කි. වින්දිතයින්ගෙන් 7%ක් විවිධ කායික හා මානසික ආබාධවලින් පසුවේ. මෙම ආබාධිත භාවය ලිංගික අපයෝජනයට ලක්වීම කෙරෙහි සෘජුව ම බලපා තිබේ. එසේ ම බහුතරයක් වින්දිතයින්ගේ යම් යම් චර්යාත්මක ලක්ෂණ ද ලිංගික අපයෝජනවලට ගොදුරුවීමට බලපා ඇති බව පර්යේෂණයේ දී හඳුනාගත හැකි විය. වින්දිතයින්ගේ දුරකථන භාවිතය, අන්තර්ජාල භාවිතය, ප්‍රේම සම්බන්ධතා, ඇතැම් අපචාරී චර්යා ලිංගික අපයෝජනවලට ගොදුරුවීමට සැලකියයුතු බලපෑමක් සිදුකරයි. වින්දිතයින්ගෙන් 46%ක් දුරකථන භාවිතකරන අතර ඔවුන්ගෙන් 13%ක් මෙම භාවිතය නිසා ම ලිංගික අතවරවලට ලක් වී තිබේ. වින්දිතයින්ගෙන් 8%ක් අන්තර්ජාලය භාවිතකරන අතර ඔවුන්ගෙන් 42%ක් අන්තර්ජාලය හරහා ලිංගික අපයෝජනවලට ගොදුරු වී තිබේ. වින්දිතයින්ට බලපාන යම් යම් ගැටලුකාරී තත්ත්වයන් දෙමාපියන්ට පවසා තිබෙන්නේ 66%ක් වන අතර 34%ක් ගැටලු පැවසීමට වෙනත් පුද්ගලයින් තෝරාගෙන තිබේ. 13%ක් තමන්ට බලපාන ගැටලු කිසිවකුටත් පවසා නැත. වින්දිතයින් 24%ක් නිවැසියන් සමග දැඩි කෝන්තියෙන් පසුවන බව වාර්තාවන අතර මෙය අන්තර් පුද්ගල සම්බන්ධතා පැවැත්වීමේ අඩුපාඩු වේ. ඒ අනුව අන්තර් පුද්ගල සම්බන්ධතා යහපත් ලෙස පැවැත්වීමට දරුවා පූර්වයේ සිට ම නිවැරදි සමාජානුයෝජන ක්‍රියාවලියකට භාජන කළයුතු අතර මෙය පවුලේ ප්‍රධාන වගකීමක් වේ. ඒ අනුව ලිංගික අපයෝජනය සඳහා හේතු වූ වින්දිත දරුවන්ගේ යම් යම් චර්යාත්මක දුර්වලතාවන් සඳහා සෘජුව ම සහ වක්‍රවත් දරුවා ජීවත්වන පවුල වගකිව යුතුය. ලිංගික අපයෝජනයට ගොදුරුවීම සඳහා වින්දිතයින්ගේ පවුලේ දුර්වලතා ප්‍රබල වශයෙන් ම බලපා තිබේ. මෙම පර්යේෂණ අධ්‍යයනයේ දී වින්දිත පවුල්වල පහත සඳහන් දුර්වලතාවන් හඳුනාගත හැකි විය. ඒ අනුව පවුලේ ආර්ථික දුර්වලතා, දෙමාපියන්ගේ අඩු අධ්‍යාපනය, දෙමාපියන් මියයාම, තනි මාපිය පවුල, දෙමාපියන් පවුල හැරයාම, දෙමාපියන්ගේ අනියම් සම්බන්ධතා, දෙමාපියන්ගේ දෙවන විවාහය, දෙමාපියන් විදේශගත වීම, දෙමාපියන්ගේ මත්පැන් මත්ද්‍රව්‍ය භාවිතය, දෙමාපිය අඩු අවධානය, පවුල් ආරවුල්, මව පියා දෙදෙනා ම ඒකියාවක නියැලීම, දෙමාපිය නොහික්මුණු චර්යා රටාව සහ නිවසේ පහසුකම් ප්‍රමාණවත් නොවීම වැනි සාධක හඳුනාගනු ලැබීය. ළමයින්ගෙන් සැලකියුතු පිරිසක් වින්දිතභාවයට පත්වීමට බලපා තිබෙන්නේ මව හෝ පියා සහ දෙමාපියන් අහිමිවීම යි. පර්යේෂණයෙන් හඳුනාගත් පරිදි ළමයින් 84 දෙනකුට හෙවත් 37%කට දෙමාපියන් අහිමි වීමට බලපෑ හේතුව පහත වගුව තුළ නිරූපණය කර තිබේ.

**වගු අංකය 2.** වින්දිතයින්ට දෙමාපියන්, මව හෝ පියා අහිමිවීමට හේතු

| දෙමාපියන්, මව හෝ පියා අහිමිවීමට හේතුව | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| 1. දෙමාපියන් මියයාම | 1 | 1 |
| 2. මව මියයාම | 4 | 5 |
| 3. පියා මියයාම | 19 | 23 |
| 4. මව පවුල හැරයාම | 11 | 13 |
| 5. පියා පවුල හැරයාම | 36 | 43 |
| 6. දීර්ඝ කාලයක සිට දෙමාපියන් විදේශ ගතවීම හෝ වෙනත් ප්‍රදේශයක ජීවත්වීම | 3 | 4 |
| 7. මව මියයාම සහ පියා පවුල හැරයාම | 2 | 2 |
| 8. මව පියා දෙදෙනා ම පවුල හැරයාම | 4 | 5 |
| 9. පියා මියයාම සහ මව පවුල හැරයාම | 2 | 2 |
| 10. පියා පවුල හැරයාම සහ මව දීර්ඝ කාලයක සිට වෙනත් ප්‍රදේශයක ජීවත්වීම | 1 | 1 |
| 11. පියා පවුල හැරයාම සහ මව දීර්ඝ කාලයක සිට විදේශ ගතවීම | 1 | 1 |
| **එකතුව** | **84** | **100** |

(මූලාශ්‍රය - අධ්‍යයන නියැදි සමීක්ෂණය 2019-2020)

මෙරට ජීවත්වන ළමයින් සැලකියයුතු පිරිසකට ඉහත දක් වූ විවිධ හේතු මත දෙමාපියන් අහිමි වන අවස්ථා වාර්තා වේ. මෙම දරුවන්ගෙන් බහුතරයක් ලිංගික අපයෝජන ද ඇතුලු වෙනත් විවිධ ගණයේ අපයෝජනවලට ගොදුරු වන බව හඳුනාගත හැකිය.

දෙමාපියන්ගේ අඩු අධ්‍යාපනය, නූගත්කම ද ළමා ලිංගික අපයෝජනය සඳහා බලපා ඇති බව පෙනෙයි. පර්යේෂණය අනුව පියවරුන්ගෙන් 68%කට 10-11 ශ්‍රේණිවලින් ඉහළ අධ්‍යාපනයක් ලැබීමට නොහැකි වී තිබේ. මව්වරුන්ගේ මෙම ප්‍රතිශතය 62%කි. නමවන ශ්‍රේණියට සහ ඊට පහළ අධ්‍යාපනයක් ලැබූ පියවරුන්ගේ ප්‍රතිශතය 50%ක් වන අතර මව්වරුන්ගේ ප්‍රතිශතය 40%කි. ඒ අනුව වින්දිතයින්ගේ දෙමාපියන් අඩු අධ්‍යාපනයක් ලබා ඇති බව පැහැදිලි වේ. දරුවන් ට ද නිසි අධ්‍යාපනයක් ලබාදීමට මේ නිසා නොහැකි වී ඇති අතර ලිංගික අපයෝජනවලින් ආරක්ෂාවීමේ ක්‍රම සහ ලිංගික අධ්‍යාපනය පිළිබඳ සරල හෝ අවබෝධයක් ලබාදීම මේ නිසා මග හැරී ඇත. ඉහළ අධ්‍යාපනයක් ලැබූ දෙමාපියන් සිටින පවුල්වල දරුවන් ලිංගික අපයෝජනයට ගොදුරු නොවනවායැයි මෙයින් අදහස් නොවන අතර දෙමාපිය අනවබෝධය හා නූගත්කම සැලකියයුතු ආකාරයකින් ළමා වින්දිතභාවයට බලපා තිබෙන බව පර්යේෂණයෙන් අනාවරණය වී තිබේ.

වින්දිත පවුල්වල ආර්ථික දරිද්‍රතාව ද ළමා ලිංගික අපයෝජනය සඳහා බලපා තිබෙන ප්‍රධාන සාධකයකි. දෙමාපියන්ගෙන් බහුතරයක් අවිධිමත් රැකියාවන්වල නියැලීම හේතුවෙන් එම පවුල්වල ආර්ථික මට්ටම ද පහළ අගයක් ගෙන තිබේ. රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සේවයකරන පියවරුන්ගේ මුලු ප්‍රතිශතය 24%ක් වන අතර මව්වරුන්ගේ ප්‍රතිශතය 14%කි. ඒ අනුව අනෙකුත් පියවරුන් සියලුදෙනා කම්කරු, ස්වයං රැකියා සහ සුලු ව්‍යාපාර සිදුකරති. මව්රුන්ගේ රැකියාව ද මෙම වර්ග කිරීම යටතේ ම දක්වා ඇති අතර රැකියාවක් නොකරන මව්වරුන්ගේ ප්‍රතිශතය 39%ක් වේ. ඒ අනුව බහුතරයකගේ රැකියාවේ ස්වභාවය, ඔවුන්ගේ ආර්ථිකය පහළ මට්ටමකට ඇද දැමීමට හේතු වී තිබේ. සාමාජිකයින් කිහිපදෙනකු සිටින පවුලකට රුපියල් 30,000/= මාසික ආදායමක් ප්‍රමාණවත් නොවෙයි. මෙවැනි පවුල් 48%ක් පමණ අධ්‍යයනයේ දී හඳුනාගෙන තිබේ. වින්දිත පවුල් 91%කට වෙනත් කිසිදු ආදායම් මාර්ගයක් නැත. එසේ ම පවුල්වලින් 33%ක් කුමන හෝ රාජ්‍ය සහනාධාරයකට හිමිකම් කීමෙන් එම පවුල්වල ආර්ථික දරිද්‍රතාව පැහැදිලිකරයි. එසේ ම පවුල්වලින් 56%ක් විවිධ හේතු සඳහා ණය වී තිබේ. සැලකියයුතු පිරිසකගේ නිවසේ පහසුකම් අවම මට්ටමකින් පවතියි. ඒ අනුව ආර්ථික වශයෙන් පීඩාවට පත්ව සිටින මෙවැනි පවුල්වල ජීවත්වන ළමයින් පිළිබඳ අපයෝජකයින්ගේ වැඩි අවධානයක් යොමු වේ. එසේ ම ආර්ථික අගහිඟකම්වලින් පීඩා විඳින වින්දිතයින් අපයෝජකයින්ගෙන් පිළිසරණ පැතීමට ගොස් වින්දිත භාවයට පත් වූ අවස්ථා කිහිපයක් ම පර්යේෂණයේ දී අනාවරණය වී තිබේ. මේ අනුව පවුලක ආර්ථික දරිද්‍රතාව එම පවුල්වල දරුවන් ලිංගික අපයෝජනවලට ගොදුරුවීමට සැලකියයුතු බලපෑමක් සිදුකරයි.

මව පියා හෝ දෙදෙනාගෙන් එක් අයකු විදේශගතවීම ද ළමා ලිංගික අපයෝජනය සඳහා බලපාන ප්‍රබල සාධකයක් වේ. විශේෂයෙන් ම වින්දිතයින්ගේ මව්වරුන් 9%ක් තම දරුවන් ලිංගික අපයෝජනයට ගොදුරුවන විට විදේශගත වී සිට තිබේ. එසේ ම අපයෝජනය සිදුවීමට පෙර ද මව්වරුන්ගෙන් 20%ක් විදේශගත වී තිබේ. වින්දිතයින්ගේ පියවරු 3%ක් අපයෝජනය සිදුවන විට විදේශගත වී සිට ඇත. ඒ අනුව මව පියා දෙදෙනා ම හෝ විශේෂයෙන් ම මව විදේශගතවීම එම පවුල්වල ළමයින් ලිංගික අතවරවලට ලක්වීමේ වැඩි අවධානමක් ඇතිකරයි. මව විදේශගතවීම එම පවුල්වල ජීවත්වන ගැහැණු ළමයි පියා, සුලු පියා සහ වෙනත් ඥතීන්, අසල්වාසීන්ගෙන් ලිංගික අතවරයට ලක් වූ අවස්ථා පර්යේෂණයේ දී ද හඳුනාගත හැකිවිය.

මව පියා දෙදෙනා ම රැකියාවක නියැලීම පමණක් නොව ඔවුන් රැකියාවට ගොස් පැමිණෙනතුරු දරුවන් ආරක්ෂිතව රැඳී සිටින අකාරය ද ලිංගික අපයෝජනයට ලක්වීම සම්බන්ධයෙන් සාකච්ඡාවේ දී ඉතා ම වැදගත් වේ. මව හෝ පියා සේවයට ගොස් පැමිණෙනතුරු මව සමග හෝ පියා සමග නිවසෙහි රැඳී සිටින වින්දිතයින්ගේ ප්‍රතිශතය 41%කි. අපයෝජනයට ලක් වූ ළමයින්ගෙන් 59%ක් මව පියා සේවයකර පැමිණෙනතුරු තනිව ම හෝ වෙනත් කවර හෝ පුද්ගලයකු සමග රැඳී සිට ඇත. මෙය ද අවධානම් තත්ත්වයක් ලෙස සැලකිය හැකිය. එසේම වින්දිතයින්ගෙන් 53%ක් තම දෙමාපියන් තමන් පිළිබඳව අඩු අවධානයක් යොමුකර ඇති බව ප්‍රකාශකරයි. මෙවැනි අනාරක්ෂිත තත්ත්වයන් ලිංගික අපයෝජනට ලක්වීම කෙරෙහි නිතැතින් ම බලපායි.

පියාගේ මත් ද්‍රව්‍ය භාවිතය ද එම පවුල්වල ජීවත්වන දරුවන් ලිංගික අපයෝජනවලට ගොදුරුවීම කෙරෙහි ප්‍රබල වශයෙන් බලපායි. පියවරුන්ගෙන් අති බහුතරයක් හෙවත් 80%ක් මත්පැන් මත්ද්‍රව්‍ය භාවිතකරන බව හඳුනාගෙන තිබේ. මත්පැන් මත්ද්‍රව්‍ය භාවිතය නිසා පවුල්වලින් 42%ක ගැටුම් ඇති වී තිබේ. මත් ද්‍රව්‍ය භාවිතකර සිහිමඳව සිටින පියකුගෙන් දරුවන්ට නිසි ආරක්ෂාව හා රැකවරණයක් අපේක්ෂා කළ නොහැකිය. ඇතැම්විට අපයෝජනවලට පෙළඹෙන්නේ ඔවුන්මය. මේ නිසා මත්පැන් මත්ද්‍රව්‍ය භාවිතය ළමා ලිංගික අපයෝජනය සඳහා බලපාන ප්‍රධාන හේතු සාධකයකි.

වෙනත් විවිධ හේතු සාධක පදනම්කරගෙන වින්දිත පවුල් 41%ක ගැටුම් ඇති වී තිබේ. එම ගැටුම්වලින් 52%ක් ම මව හා පියාගේ අනියම් සම්බන්ධතා නිසා සිදු වී තිබේ. භාරකරුවන් 62%ක් අනියම්

සම්බන්ධතා පවත්වන බව දෙමාපිය නියැදියේ දී හඳුනාගෙන තිබේ. එසේ ම වින්දිතයින් 15%කගේ දෙමාපියන් ස්ථිර වශයෙන් පවතින විවිධ කායික මානසික රෝගී තත්ත්වයන්ගෙන් පෙළෙන අය වෙති. මෙවැනි දුර්වලතාවන් ද ලිංගික අපයෝජන සඳහා ඍජුව ම බලපාන සාධක වේ.

මෙම පර්යේෂණයේ දී හඳුනාගනු ලැබූ දෙමාපියන් දරුවන් සමග පවත්නා දුර්වල අන්තර් සම්බන්ධතාව ද ලිංගික අපයෝජනය සඳහා බලපාන තවත් ප්‍රධාන සාධකයකි. දරුවන් සමග ගත කිරීමට පමණක් දෛනික කාලයෙන්, යම් නිශ්චිත හෝ විශේෂ කාල සීමාවක් වෙන්කර ඇත්තේ දෙමාපියන්ගෙන් 11%ක් තරම්වන අවම ප්‍රතිශතයකි. එසේ ම දෙමාපියන්ගෙන් 85%ක් තම දරුවන්ගේ දෛනික දින චර්යාව ගත වූ ආකාරය පිළිබඳ කිසිදු විමසීමක් සිදුනොකරයි. භාරකරුවන් විසින් ම තම දරුවන් පිළිබඳ අඩු අවධානයක් යොමුකර ඇති බව පිළිගෙන තිබේ. එසේ පිළිගත් ප්‍රතිශතය 57%කි. දෙමාපියන්ගෙන් 60%ක් තම දරුවාට සිදු වූ ලිංගික අපයෝජනය දැනගෙන තිබෙන්නේ වෙනත් පුද්ගයකුගෙන් හෝ මාර්ගයකින්ය. මෙය දරුවන් සහ දෙමාපියන් අතර තිබෙන දුර්වල අන්තර් සම්බන්ධතාවන් වඩාත් පැහැදිලිකරන තත්ත්වයකි. ලිංගික අපයෝජනවලින් ආරක්ෂාවීමේ ක්‍රමෝපායන් පිළිබඳව භාරකරුවන්ගෙන් 79%කට තම දරුවන් දැනුවත් කිරීමට නොහැකි වී තිබේ. දෙමාපියන්ගෙන් 30%ක් සිය ළමා කාලයේ දී ලිංගික අපයෝජනයකට ගොදුරු වී තිබේ. ඒ අනුව ඔවුන්ගේ දරුවන්ට ද එම ඉරණම ම අත්විඳීමට සිදුව තිබේ. එසේ ම විවිධ වැරදි චර්යාවන්ගේ නියැලීම හේතුවෙන් භාරකරුවන්ගෙන් 61%ක් පොලිස් නීතිමය කටයුතුවලට ද, 21%ක් අධිකරණ කටයුතුවලට ද සම්බන්ධ වී තිබේ.

ඉහතින් විස්තර කළ කරුණු, පර්යේෂණයෙන් හඳුනාගත් පවුලේ ගැටලුකාරී තත්ත්වයන් වන අතර ඒවා ඍජුව ම එම පවුල්වල ළමයි ලිංගික අපයෝජනවලට ගොදුරුවීමට හේතු වී තිබේ.

පර්යේෂණයේ දත්ත සාධක විශ්ලේෂණයක් සිදුකිරීම තුළින්, ළමා ලිංගික අපයෝජනය සඳහා බලපාන ප්‍රධාන හේතු සාධක 11ක් හඳුනාගෙන ඇත. එම හේතු සාධක ළමයි ලිංගික අපයෝජනයට ලක්වීම අතර පවතින සහසම්බන්ධතාව පහත වගුවෙහි නිරූපණය වේ.

**වගු අංක 3.** ළමා ලිංගික අපයෝජනයට බලපාන හේතු (ලකුණු න්‍යාසයේ අගයන් තුළින්)

| සංරචකය | පළමු සාධකය | දෙවන සාධකය | තෙවන සාධකය | සිව්වන සාධකය |
|---|---|---|---|---|
| දෙමාපියන්ගේ නුගත්කම හා ලිංගික අධ්‍යාපනය පිළිබඳ නොදැනුවත් කම | -0.312 | 0.631 | 0.931 | -0.871 |
| අසල්වාසීන් සමඟ තිබෙන අයහපත් අන්තර් සම්බන්ධතාව | 0.019 | 0.857 | -0.842 | -0.003 |
| නිවසේ පවතින අඩු යටිතල පහසුකම් තත්ත්වය | 0.09 | -0.314 | 0111 | 0.998 |
| මව හෝ පියා නොමැතිකම හෝ දෙමාපියන්ගේ අනියම් සම්බන්ධතා | 0.748 | -0.682 | -0.748 | -0.321 |
| දෙමාපියන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය | 0.911 | -0.397 | 0.03 | 0.491 |
| දරුවා සමාජය සමඟ සම්බන්ධ නොවීම | 0.01 | 0.898 | 0.697 | -0.312 |
| දෙමාපියන් හා දරුවන් අතර පවතින අයහපත් අන්තර් සම්බන්ධතාවන් | 0.784 | 0.087 | 0.221 | -0.264 |
| පවුලේ ආර්ථිකය ශක්තිමත් නොවීම | 0.07 | -0.512 | 0.542 | 0.912 |
| දරුවා පාසල් නොයාම හා ලිංගික අධ්‍යාපනය පිළිබඳ නොදැනුවත් කම | 0.02 | 0.04 | 0.927 | 0.325 |
| භාරකරුවකු යටතේ ජීවත්වීමට සිදුවීම | 0.741 | 0.321 | 0.02 | 0.03 |
| දරුවා ජීවත්වන පවුල පිළිබඳ සමාජය දරන අයහපත් ආකල්පය | -0.348 | 0.921 | 0.632 | 0.741 |

(මූලාශ්‍රය - අධ්‍යයන නියැදි සමීක්ෂණය 2019-2020)

ඒ අනුව දෙමාපියන්ගේ නුගත්කම හා ලිංගික අධ්‍යාපනය පිළිබඳ නොදැනුවත්කම, ළමයි ලිංගික අපයෝජනයට ලක්වීමත් අතර 93%ක සම්බන්ධතාවක් පවතියි. අසල්වාසීන් සමඟ තිබෙන අයහපත් අන්තර් සම්බන්ධතාව සහ ලිංගික අපයෝජනයට ලක්වීම අතර 85% ක සම්බන්ධතාවක් ද, නිවසේ පවතින අඩු යටිතල පහසුකම් පිළිබඳ තත්ත්වය ලිංගික අපයෝජනයට ගොදුරු වීමත් අතර 99%ක සම්බන්ධතාවක් ද, මව, පියා නොමැතිකම හෝ දෙමාපියන්ගේ අනියම් සම්බන්ධතා පැවතීම, ළමයි ලිංගික අපයෝජනයට ගොදුරුවීමත් අතර 74%

ක සම්බන්ධතාවක් ද, දෙමාපියන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය ළමයි ලිංගික අපයෝජනයට ලක්වීම අතර 91% ක සම්බන්ධතාවක් ද, දරුවා සමාජය සමග සම්බන්ධ නොවීම හා ලිංගික අතවරවලට ගොදුරුවීමත් අතර 89%ක සම්බන්ධතාවක් ද, දෙමාපියන් හා දරුවන් අතර පවතින අයහපත් අන්තර් සම්බන්ධතාවන් ළමා ලිංගික අපයෝජනයට ගොදුරුවීමෙහිලා 78%ක සම්බන්ධතාවක් ද, පවුලේ ආර්ථිකය ශක්තිමත් නොවීම ලිංගික අපයෝජනයට ලක්වීම අතර 91%ක සම්බන්ධතාවක් ද, දරුවා පාසල් නොයාම හා ලිංගික අධ්‍යාපනය පිළිබඳ නොදැනුවත්කම ළමා ලිංගික අපයෝජනයට ලක්වීම අතර 92%ක සහසම්බන්ධතාවක් ද, භාරකරුවකු යටතේ ජීවත්වීමට සිදුවීම හා ලිංගික අපයෝජනයට ගොදුරුවීමත් අතර 74% ක සම්බන්ධතාවක් ද, දරුවා ජීවත්වන පවුල පිළිබඳ සමාජය දරණ අයහපත් ආකල්පය ළමා ලිංගික අපයෝජනයට ගොදුරු වීම අතර 92%ක සම්බන්ධතාවක් ද පවතින බව අනාවරණය වී තිබේ. ඒ අනුව මෙම පර්යේෂණයේ දත්ත සාධක විශ්ලේෂණය තුළින් ළමා ලිංගික අපයෝජනය සහ පවුලේ ගැටලු, දුර්වලතා අතර අති ප්‍රබල සහසම්බන්ධතාවක් පවතින බව පැහැදිලි වේ.

ලිංගික අපයෝජනයට ලක්වීමෙන් වින්දිතයින් ගැටලු රාශියකට මුහුණදෙනු ලබන අතර එසේ සිදුවන බලපෑම් කෙටි කාලීන සහ දීර්ඝ කාලීනව සිදුවන බලපෑම් ලෙස වර්ග කළ හැකිය. ඒ අනුව සෞඛ්‍ය, නීති, අධ්‍යාපන, සමාජ හා පවුල් ආදී ප්‍රධාන ගැටලු කිහිපයකට සහ ගැබ් ගැනීම, පදිංචිය වෙනස්කිරීම ආදී ගැටලුකාරී තත්ත්වයන්ට ද වින්දිතයින් මුහුණ දී ඇත. එක් එක් ගැටලුව මගින් සිදු වූ බලපෑම වෙන වෙන ම ඉදිරිපත් කිරීමේ දී සමස්ත නියැදියෙන් 79%ක් සෞඛ්‍ය ගැටලුවලට මුහුණ දී ඇත. එසේ ම නීතිමය ගැටලුවලට 99.6%ක් ද, අධ්‍යාපන ගැටලුවලට 84%ක් ද, සමාජ ගැටලුවලට 88%ක් ද, පවුල් ගැටලුවලට 55%ක් ද මුහුණ දී ඇත. ගැබ් ගැනීම නිසා 14%ක් වින්දිතභාවයට පත් වී ඇත. ලිංගික අපයෝජනයට ගොදුරුවීම නිසා ඇති වූ ගැටලු සහ අපහසුතා නිසා වින්දිතයින් සහ ඔවුන්ගේ පවුල් 6%ක් පදිංචිය හැරගොස් ඇත. අදාළ අපයෝජනය නිසා රෝහල් ගතවීමට සිදු වූ වින්දිතයින්ගේ මුළු සංඛ්‍යාව 169කි. එය ප්‍රතිශතයක් ලෙස 74%කි. ඒ අනුව 168/169 ක් ම රෝහල් ගත වී ඇත්තේ වෛද්‍ය පරීක්ෂණය සඳහා සහභාගීවීමටය. කෙසේ නමුත් මොවුන්ගෙන් 41 දෙනකුට මානසික ප්‍රතිකාර ද සිදුකර තිබේ. වින්දිතයින් 30 දෙනකු දීර්ඝකාලීනව මානසික ප්‍රතිකාර ලබාගෙන තිබේ. ලිංගික අපයෝජන නිසා නීති ගැටලුවලට මුහුණදුන් වින්දිතයින්ගෙන් 99.6% පොලිස් මර්ශන කටයුතුවලට ද, 76%ක් අධිකරණ ගැටලුවලට ද, 65%ක් පරිවාස අධීක්ෂණය හා පරිවාසගතවීමේ ගැටලුවලට ද මුහුණ දී තිබේ. එසේ ම ඉගෙනීමේ අපහසුතාවලට 84%ක් මුහුණ දී ඇති අතර වින්දිතයින් 58%කට පාසල් යාමට බාධා වී තිබේ. පවුල් ගැටලුවලට මුහුණදුන් වින්දිතයින්, දෙමාපියන්ගේ බැණවැදීම, පහරදීම්, පවුලෙන් ප්‍රතික්ෂේපකිරීම, සහ භාරකාරීත්වය වෙනස්කිරීම යන ගැටලුවලට මුහණ දී ඇත. ලිංගික අපයෝජනය නිසා වින්දිතයින් පශ්චාද් ගැටලුවලට ද මුහුණ දී ඇත. එසේ මුහුණදුන් ප්‍රතිශතය 55%ක් වේ. මේ නිසා සිදු වූ මානසික පීඩනය වරින්වර ඉස්මතුවීම ජීවිත කාලය පුරාවට ම බලපෑම් ඇතිකළ හැකිය.

ළමා ලිංගික අපයෝජනය පාලනය හා නිවාරණය සඳහා නියැදීන් තුන නියෝජනය කරන දත්තදායකයින් විසින් යෝජනා ඉදිරිපත් කර තිබේ. ළමා ලිංගික අපයෝජනය පාලනය සඳහා වින්දිතයින් බහුතරයක් ඉදිරිපත් කරන යෝජනාව වන්නේ අපයෝජකයින්ට එරෙහිව දැඩි දඬුවම් ක්‍රියාත්මක කිරීමයි. වින්දිතයින් 64%ක් මෙම යෝජනාව ඉදිරිපත් කර තිබේ. එසේ ම දරුවන් දැනුවත් කිරීම, දෙමාපියන් හා සමාජය දැනුවත් කිරීම, දෙමාපියන්ගේ අවධානය වැඩිවීම, යහපත් පවුල් පසුබිමක ක්‍රියාකාරීත්වය සහ ළමයින් සම්බන්ධයෙන් කටයුතුකරන නිළධාරීන්ගේ කාර්යක්ෂම බව ලිංගික අපයෝජනය පාලනයට ඉදිරිපත් කරන අනෙකුත් යෝජනා වේ. වින්දිතයින්ගේ භාරකරුවන් ද ළමා ලිංගික අපයෝජනය පාලනය සඳහා යෝජනා ඉදිරිපත්කරයි. දෙමාපියන් බහුතරයකගේ මතය වන්නේ ද නීතිය ක්‍රියාත්මක කිරීම මගින් ළමයින්ට සිදුවන ලිංගික අපයෝජනය පාලනය කළ හැකි බවයි. භාරකරුවන්ගෙන් 58%ක් මෙම යෝජනාව ඉදිරිපත් කරයි. මීට අමතරව දෙමාපියන් දැනුවත් කිරීම, දෙමාපිය අවධානය වැඩිවීම සහ වැඩිහිටි ප්‍රජාව දැනුවත් කිරීම ලිංගික අපයෝජනය පාලනයට භාරකරුවන් ඉදිරිපත් කරන යෝජනා වේ. ක්ෂේත්‍රයට සම්බන්ධ රාජ්‍ය නිළධාරීන් ලිංගික අපයෝජනය පාලනයට ඉදිරිපත්කරන ප්‍රධාන යෝජනාව වන්නේ සමස්ත සමාජය ම දැනුවත් කළයුතු බවයි. මීට අමතරව නීතිය ක්‍රියාත්මක කිරීම, ළමයින් දැනුවත් කිරීම, දෙමාපිය රැකවරණය වැඩිවීම, ලිංගික අධ්‍යාපනය ලබාදීම, දැඩි නීති රීති සම්පාදනය, පවුල ශක්තිමත් කිරීම සහ ඉලක්කගත කණ්ඩායම් දැනුවත් කිරීම මගින් ලිංගික අපයෝජනය පාලනය කළ හැකි බව දක්වා ඇත.

ළමයින්ට එරෙහිව සිදුවන ලිංගික අපයෝජනය නිවාරණය පිළිබඳව ද පර්යේෂණයේ දී අවධානය යොමුකර තිබේ. වින්දිතයින්ගෙන් 49%ක් ප්‍රකාශකර තිබෙන්නේ දැඩි නීති රීති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීමෙන් ළමා ලිංගික අපයෝජනය නිවාරණය කළ හැකි බවයි. භාරකරුවන් සහ නිළධාරීන් බහුතරයකගේ අදහස වන්නේ ද නව නීති සම්පාදනය තුළින් ලිංගික අපයෝජනය නිවාරණය කළ හැකි බවයි. මීට අමතරව මෙම නියැදින් තුනේ දී ඉදිරිපත් කළ යෝජනා සාරාංශ කළ විට ශක්තිමත් පවුල් පරිසරයක් ගොඩනැංවීම, දෙමාපියන් දැනුවත් කිරීම, සමාජය දැනුවත් කිරීම, දෙමාපියන්ගේ දැඩි ආරක්ෂාවක් හා රැකවරණයක් ලැබීම, දරුවන් දැනුවත් කිරීම, දෙමාපියන්ගේ දැඩි අවධානය දරුවන්ට යොමුකිරීම, ඉලක්කගත කණ්ඩායම් දැනුවත්කිරීම සහ ලිංගික අධ්‍යාපනය ලබාදීම ළමා

ලිංගික අපයෝජනය නිවාරණය සම්බන්ධයෙන් ඉදිරිපත් වූ වැදගත් යේජනා වේ.

## 4. නිගමන සහ නිර්දෙශ

ළමා ලිංගික අපයෝජනය සඳහා බලපාන පවුල් පාරිසරික සාධක හඳුනාගැනීමට සිදුකළ මෙම පර්යේෂණයේ දී ලිංගික අපයෝජනය සඳහා වින්දිතයින්ගේ පවුලේ යම් යම් දුර්වලතා අඩු වැඩි වශයෙන් බලපා තිබෙන බව හඳුනාගත හැකිවිය. පවුලේ මෙම ගැටලු සහගත තත්ත්වයන් නිරාකරණයට හෝ පිළියම් යෙදීමට වින්දිතයින්ට හැකියාව නොමැති වුවත් කුමන හෝ පාර්ශ්වයක මැදිහත්වීමෙන් ගැටලු නිරාකරණය කිරීම සිදුකළ හැකි නම් මෙරට ළමයින්ට සිදුවන ලිංගික අපයෝජන බහුතරයක් වළක්වාගැනීමේ හැකියාව පවතියි. මෙම පර්යේෂණය සිදු කිරීමෙන් නිගමන කිහිපයකට එළඹීමට හැකි විය. ඒ අනුව දෙමාපියන්ගේ නූගත්කම සහ ලිංගික අධ්‍යාපනය පිළිබඳ දැනුමක් ලබා නොතිබීම ළමයි ලිංගික අපයෝජනයට ලක්වීම අතර සමීප සම්බන්ධයක් පවතින බව නිගමනය කළ හැකිය. ඒ අනුව මෙරට ළමා ලිංගික අපයෝජනය පාලනය හා නිවාරණයට කටයුතු කිරීමේ දී ළමයින්, තරුණයින්, දෙමාපියන් හා වැඩිහිටියන්ට ප්‍රමාණවත් පරිදි ලිංගික අධ්‍යාපනයක් ලබාදීම සහ ලිංගික අපයෝජනවලින් ආරක්ෂාවීමේ ක්‍රමවේද, කුසලතා ඇතිකිරීම අනිවාර්යයෙන් සිදුකළයුතු බව තහවුරු වේ. වින්දිත පවුල් බහුතරයක් සිය අසල්වාසීන් සහ සමාජය සමග අයහපත් අන්තර් සම්බන්ධතා පවත්වනු ලැබේ. ඒ අනුව සාමාජීයයන්ගෙන් දරුවාට ලැබෙන ආරක්ෂාව හා රැකවරණය මේ නිසා අහිමි වී තිබේ. දෙමාපියන් අහිමි වීම, තනි මාපිය පවුලක ජීවත්වන හෝ වෙනත් භාරකරුවකු යටතේ ජීවත්වන ළමයි ලිංගික අපයෝජනවලට ගොදුරුවීමේ වැඩි අවධානමක් පවතින බව පර්යේෂණයේ දී හඳුනාගත හැකිවිය. ළමා ලිංගික අපයෝජනය පාලනය හා නිවාරණය සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී ඉහත පවුල්වලට විශේෂ අවධානයක් යොමුකළ යුතුය. දෙමාපියන් අනියම් සම්බන්ධතා පැවැත්වීම සහ දෙවන වර හෝ වෙනත් විවාහයන් සිදුකරගැනීම ද ළමා ලිංගික අපයෝජනය සඳහා හේතු වේ. පවුලේ ආර්ථික දුෂ්කරතා පැවතීම ද එම පවුල්වල දරුවන්ට ලිංගික අතවර සිදුවීමට දැඩි අවදානම්කාරී සාධකයක් ලෙස හඳුනාගෙන තිබේ. අධ්‍යයනයේ පවුල් බහුතරයක් ප්‍රමාණවත් ආදායමක් නොලබන අතර සැලකියයුතු පවුල් ගණනක් සමෘද්ධි ආධාරය හෝ රජයේ වෙනත් ආධාරයක් ලැබීමෙන් ඒ බව තහවුරු වේ. පියවරුන්ගේ මත්පැන් මත්ද්‍රව්‍ය භාවිතය සහ ළමයින් ලිංගික අපයෝජනයට ගොදුරුවීම අතර දැඩි සම්බන්ධයක් පවතින බව මෙම අධ්‍යයනයේ දී සොයා ගෙන ඇත. වින්දිතයින්ගේ පියවරුන් අති බහුතරයක් මත්පැන් හෝ මත්ද්‍රව්‍යය භාවිතකරයි. දෙමාපියන් විදේශගතවීම ද වින්දිතභාවයට ප්‍රබල හේතු සාධකයක් වන අතර විදේශ ගතවීම් සැලකියයුතු සංඛ්‍යාවක් අධ්‍යයනයේ දී හඳුනාගත හැකි විය. මව රැකියාවක් සිදුකිරීම ද ඇතැම් විට ළමයින් ලිංගික අපයෝජනවලට ගොදුරුවීමට හේතු වී තිබේ. පියා අහිමි පවුල්වල මව්වරුන් බොහෝ විට ආර්ථික කටයුත්තක නියැලෙන අතර මව පියා දෙදෙනා ම රැකියා සිදුකරන පවුල් ද හමු වේ. කෙසේ නමුත් මව හෝ දෙමාපියන්ගෙන් කෙනෙක් නිවසේ රැඳී නොසිටීම ළමයින්ගේ ආරක්ෂාවට තර්ජනයක් වන අතර ලිංගික අපයෝජනවලට ගොදුරුවීමේ අවධානමක් පවතියි. දරුවන් හා දෙමාපියන් අතර යහපත් අන්තර් සම්බන්ධතාවක් නොපැවතීම ලිංගික අපයෝජන සිදුවීමට බලපාන ප්‍රධාන සාධකයක් ලෙස හඳුනාගෙන ඇත. එසේ ම පවුල් ආරවුල් සිදුවීම, දෙමාපියන්ගේ විවිධ කායික හා මානසික ආබාධ, දෙමාපියන්ගේ රැකියාවේ ස්වභාවය, දෙමාපියන්ගේ සමාජ විරෝධි චර්යා රටාවන්, ඔවුන්ගේ කුසලතා හා ආකල්ප මද බව, දෙමාපියන් ළමා කාලයේ දී ලිංගික අතවරයට ලක්වීම, විකල්ප රැකවරණයක් නොලැබීම, පවුලේ ආගමික සදාචාරමය පරිහානිය, අපයෝජක සහ පවුල් අතර පවතින සමීප සම්බන්ධතාව ළමයි ලිංගික වශයෙන් අපයෝජනයට ලක්වීමට අඩු වැඩි වශයෙන් බලපා ඇති බව මෙම අධ්‍යයනයේ දී හඳුනාගත හැකිවිය. මෙම ගැටලු පවුලේ අක්‍රමිකතා නිසා ඇතිවන අතර ඒවා ළමා ලිංගික අපයෝජනය අතර ඍජු සම්බන්ධතාවක් පවතින බව නිගමනය කළහැකිය.

සමවයස් කණ්ඩායම්වල බලපෑම, අඩු වයස් ප්‍රේම සම්බන්ධතා, ළමයින්ගේ අපචාරි චර්යා රටාවන්, ළමයින්ගේ විලාසිතා භාවිතය, ඔවුන්ගේ විවිධ කායික මානසිත ආබාධ, දුරකථනය හා අන්තර්ජාලය භාවිතය සහ ජීවත්වන සමාජ පරිසරයේ විවිධ දුර්වලතා ද ළමයි ලිංගික අපයෝජනයට ගොදුරුවීමත් අතර දැඩි සම්බන්ධතාවක් පවතින බව නිගමනය කළ හැකිය. අපයෝජකයා හා අපයෝජනයට ලක් වූ ස්ථානය වින්දිතයා සමග සමීප සම්බන්ධතාවක් පවතින බව පර්යේෂණයේ දී එළිඹිය හැකි තවත් ප්‍රධාන නිගමනයකි. ඒ අනුව අපයෝජකයාව මෙන් ම අපයෝජනය සිදු වූ ස්ථානය බොහෝ වින්දිතයින් විසින් හොඳින් දැනහඳුනා ගෙන ඇත. ලිංගික අපයෝජනවලින් බහුතරයක් වින්දිතයාගේ කැමැත්තට සිදු වී තිබේ. එසේ ම එක ම අපයෝජකයකුගෙන් නැවත නැවත ලිංගික අතරවරයට ලක්වීම ද මෙහි දී හඳුනාගත හැකි විය. ඇතැම් වින්දිතයින්ට වෙනත් අපයෝජකයින්ගෙන් ද ලිංගික අතවර සිදු වී ඇත. ලිංගික අපයෝජනයට ලක්වීමෙන් විශාල ගැටලු ප්‍රමාණයකට මුහුණදීමට සිදුවන අතර ඒවා ඇතැම් ළමයින්ට පශ්චාද් කාලීන වශයෙන් ද විශාල බලපෑමක් සිදුකර ඇති බව හඳුනාගත හැකිය.

ළමා ලිංගික අපයෝජනය පාලනය හා නිවාරණය සඳහා මෙම පර්යේෂණයේ දී හඳුනාගත් යෝජනා ප්‍රධාන කොටස් හතරක් යටතේ සම්පිණ්ඩනය කර ඉදිරිපත් කළ හැකිය.

01. ළමයින් තුළ කුසලතා, ආකල්ප සහ දැනුම වර්ධනය කරමින් ස්වයං ආරක්ෂාවට බලගැන්වීම - පුද්ගල මට්ටම
02. ළමා හිතකාමී යහපත්, ශක්තිමත් පවුල් පරිසරයක් ගොඩනැගීම මගින් ළමා ආරක්ෂාව තහවුරු කිරීම - පවුල් මට්ටම
03. සමීප සබැඳියන් සහ ප්‍රජාව බලගැන්වීමේ ක්‍රමවේද මගින් ලිංගික අපයෝජන සිදුවීම වළක්වා ගැනීම - සමීප සබඳතා හා ප්‍රජා මට්ටම
04. සමාජ හා සංස්කෘතික තත්ත්වයන් ළමා ආරක්ෂාව තහවුරුවන පරිදි පවත්වාගෙන යාම සහ කළමනාකරණය කිරීම - සමාජ හා සංස්කෘතික මට්ටම

ඉහත සඳහන් පරිදි කරුණු හතරකට සම්පිණ්ඩනය කළ ද මෙයට පුළුල් වපසරියක ව්‍යාප්තවන පාලන හා නිවාරණ ක්‍රමවේද ඇතුළත් වේ. ඉහත පළමු මට්ටම් තුන යම් කිසි උත්සහායක්, උනන්දුවක් තුළින් කෙටි කාලයක දී වුව ද සාර්ථක ප්‍රතිඵල ළඟා කරගත හැකිය. සිව්වන මට්ටමේ දී මුළු මහත් සමාජය ම වෙනස්විය යුතුය. ආගමික, සදාචාර, සිරිත් විරිත් ආර්ථික, දේශපාලනික හා ජන මාධ්‍ය භාවිතය ද නිවැරදි ලෙස වෙනස්විය යුතුය. විශේෂයෙන් ම ජන මාධ්‍ය ලිංගික අපයෝජන වාර්තාකරණය සම්බන්ධයෙන් සදාචාරාත්මක භාවය ඉක්මවා ගොස් පවතින නීති රීති ද අතික්‍රමණය කර කටයුතුකර ඇති බව පෙනෙයි. මේ පිළිබඳව අවධානය යොමුකළ එච්.ඩී.ඊ. ගුණසේකර ඇතුළු පිරිස 2021 දී පර්යේෂණ වාර්තාවක් මගින් ද කරුණු පෙන්වා දී ඇත. ඒ අනුව ළමා ලිංගික අපයෝජනය පාලනය හා නිවාරණය ඉහත එක් කණ්ඩායමකට පමණක් සිදුකළ නොහැකි අතර කණ්ඩායම් හතර ඒකාබද්ධ ප්‍රවේශයකින් කටයුතු කළ යුතුය. මෙම ප්‍රවේශය සඳහා ළමයා, පවුල, ප්‍රජාව සහ වෙනත් කණ්ඩායම් එක් ව ළමයින්ගේ ආරක්ෂාව හා රැකවරණය වෙනුවෙන් වෙන් වෙන්ව, එකිනෙකට සම්බන්ධ කාර්ය භාර්යක් ඉටුකළ යුතුය.

## 5. ආශ්‍රිත ග්‍රන්ථ


අමරසේකර. ඩී. (2012). අපරාධ විද්‍යාව, ආරිය ප්‍රකාශකයෝ, වරකාපොල.

අමරසේකර, ඩී. (2015). ශ්‍රී ලංකාවේ සමාජ ප්‍රශ්න, ආරිය ප්‍රකාශකයෝ, වරකාපොල.

කොළඹ පොලිස් ළමා හා කාන්තා කාර්යාංශය, (2012-2020). ළමා ගහණ අපරාධ සහ ළමා සුළු අපරාධ වාර්තාව,

නිශ්ශංක, එන්. (2004). සල්ලාලයන් ළඟ පරවන ආසියාවේ මල්කැකුළු, සිළුමිණ 2004 නොවැම්බර්14, ලේක්හවුස්, කොළඹ.

පලිපාන, ඒ. (2001 දෙසැම්බර්), බාල අපචාර හා ළමා පරපුර, සත්‍ය, ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණායතනය, සමෘද්ධිඅමාත්‍යාංශය, කොළඹ.

පෙරේරා, එම්. සී. එස්. (2005). සමාජ ප්‍රශ්න, කර්තෘ ප්‍රකාශනයකි.

මුතුකුමාරණ, එස්. (1997). එතෙර වසංගත මෙතෙර ළමයි මත, වත්මන, 1997 ජනවාරි 01, සීමාසහිත උපාලි ප්‍රවෘත්ති පත්‍ර සමාගම, කොළඹ.

රත්නපාල, එන්. (2014). ශ්‍රී ලංකාවේ ගණිකාවෝ, සදීපා ප්‍රකාශන මන්දිරය, කොළඹ 08.

රත්නවේල්, ආර්. (2005). එංගලන්තයෙන් එළියට පැමිණි ලංකාවේ ළමා ජාවාරම, සිළුමිණ, 2005 පෙබරවාරි 06, ලේක්හවුස්, කොළඹ.

ශ්‍රී ලංකාපොලිස් දෙපාර්තමේන්තුව, (1995). ළමා අපයෝජනය පිළිබඳ අත්පොත, යුනිසෙෆ් ආයතනය, කොළඹ.

Amaratne, R. R. G. S. ,Vidanapathirana, M. (2016). Child Sexual Abuse in Puttalam, Srilanka: a medico-legal analysis, *Medicol-Legal Journal of Srilanka*, 2016; 4(*2*), 34-39. Available online at, 04.03.2018, https://www.researchgate.net/publication/318342134Child_sexual_abuse_in_Puttalam_Sri_Lanka_a_medico-legal_analysis

Cheah, I. G. S. , Yuen, C. W. (2016). A Review of Research on Child Abuse in Malaysia, *The Medical Journal of Malaysia*, 2016 (*71*), 87-99, Malaysian Medical Association.

Gunasekera H. D. E, Abeysekara T. B. and Weerasinghe T. (2021). A Study on the Legal Applicability of Methods used by the Sri Lankan media in reporting Child Sex Offenses, *International Journal of Research and Innovation in Social Science*, 5(*5*), ISSN 2454-6186.

Gutman, L. T. , Claire, K. K. S. , Weedy, C. (1991). human Immunodeficiency Virus Transmission by Child Sexual Abuse,1991 Feb;145(*2*),137-42 Available online at, 30.07.2018, https://jamanetwork.com/journals/jamapediatrics/article-abstract/51552

Hancock, L. (1992). Young People Involved in Prostitutionin Victoria, School of Australian and International Studies, Deakin University, geelong, Victoria. Available online at 24.07.2018,http://webcache.googleusercontent.com/search?q=cache:6Z3AthfiuvoJ:citeseerx.ist.psu.edu/viewdoc/download%3Fdoi%3D10.1.1.421.2596%26rep%3Drep1%26type%3Ddf+&cd=5&hl=en&ct=clnk&gl=lk

National Chid Protection Authority, (2021). 1929 Statistics, Available online at,01.02.2021,https://www.childprotection.gov.lk/resource-centre/statistics-3

Trangkasomba, (2008). Sexual Abuse in Thai Children:A Qualitative Study, *J Med Assoc Thai*, 91 (*9*): 1461-1467, Available online at, 10.01.2018, https://pdfs. semanticscholar.org/e751/d1eefc9c2fd396e80d0c572d71686062cbc5.pdf&ved=2ahUKEwjJtkq77rPeAhUZdCsKHWwIDQgQFjABegQICBAB&usg=AOvVaw1Q2itMwVoH0FU3YbkIY4tm

United Nation Convention On The Rights Of The Child, (1989). Available online at 02/02/2018,http://www.unesco.org/education/pdf/CHILD_E.PDF

Unicef, (2012). Together forgirls: Sexual Violence Fact Sheet, Available online at, 06.01.2018,https://www.unicef.org/protection/files/Together_for_Girls_Sexual_Violence_fact_sheet_july_2012.pdf&ved=2ahUKEwiQ_6H9j7veAhVGNI8KHe47Ab8QFjAAegQIABAB&usg=AOvVaw030wR0A8Usu41RjDUDefE